# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,936/2 — 1970 දෙසැම්බර් 14 වැනි සඳුද — 1970.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

### නගර සභා ආඥාපනත

#### 184 වැනි වගන්තිය යටතේ ආඥාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මාතර නගර සභාව සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම වුවමනාවෙන්ම පැහැර හැරීම හෝ එම රාජකාරි කටයුතු ඉටු කිරීමෙහි ලා විෂමාචාරයෙන් කටයුතු කිරීම ;

(ආ) අදක්ෂතාවය හා අයථා පාලනය ; සහ

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පුවන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට සෑහීමට පත්ව මෙම ආඥාවෙන්—

(අ) මාතර නගර සභාව විසුරුවා හරිමි. තවද,

(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අළුත් නගර සභාවක් සංස්ථාපනය කර ගන්නා තුරු, මාතර නගරයේ කටයුතු පාලනය කිරීම පිණිසද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද, විශේෂ කොමසාරිස් වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් විතාන වසම් කීර්තිචන්ද්‍රා නානායක්කාර මහතා පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 14 දින,
කොළඹ දීය.

12–776

---

### නගර සභා ආඥාපනත

#### 184 වැනි වගන්තිය යටතේ ආඥාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, බේරුවල නගර සභාවේ සභාපති අබ්දුල් බකීර් මාකර් මහතා සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම ඕනෑකමින් පැහැර හැරීම සහ එම රාජකාරි කටයුතු ඉටු කිරීමෙහි ලා විෂමාචාරයෙන් කටයුතු කිරීම ;

(ආ) අදක්ෂතාවය සහ අයථා පාලනය ; හා

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව සිටින බැවින් මේ ආඥාවෙන් එකී අබ්දුල් බකීර් මාකර් මහතා එකී නගර සභාවේ සභාපති ධුරයෙන් ඉවත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 14 දින,
කොළඹ දීය.

12–776/2


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

1 A -- ජේ 19261—5,685 (70/12)